**අප අතරින් වියෝ වූ ප්‍රවීණ ලේඛක ඩීබී කුරුප්පු මහතා පුවත්පතකට ලියූ අවසන් ලිපිය**




# නොනවතින අරගලය සහ නොවිසඳෙන ගැටළු

පනස් එක් දහස් වරසක් පුරා මේ මහ දූවේ එකම හිමිකාරයන් - එකම පදිංචිකාරයන් - හැටියට වාසය කරමින් මේ මහා භූමිතලය රැක බලාගත් - මහදූව පුරාම විහිදී ගිය ජනකොටස් බොහෝ ගණනකින් සමන්විතව ස්වාධීන පුරවැසියන් ලෙසට ජීවත් වූ ඕස්ට්‍රේලියානු ආදිවාසීන් මෙරට පුරවැසි බව ලද යුතු අසරණයන් බවට පත් කරමින් ඒ වරප්‍රසාදය දීමේ අවසරය සුදු

පෙනෙන යථාර්ථය වූකලී හාවාගේ ගුලට රිංගා ගත් ඉත්තෑවා ගේ ක්‍රියා කලාපය යළි රගපාන දර්ශනයක් මෙරටද ඉදිරිපත් වූ බව පමණි.

සුදු ආක්‍රමනිකයන්ට ඉත්තෑවාට තිබුණි ආවුද තිබුණේ නැත. ඒ වෙනුවෙට ඔවුහු සුදු මින-සාගේ නිර්මාණයක් වූ අරුම පුදුම මන්තරයක් ගායනා කරන්නට පටන් ගත්හ. ඒකත් හරියට

වාසනාවට දෙන ලද මේ විනිශ්චයට සවන් දීමට එඩී මාබෝ ජීවත්ව නොසිටීම ජාතියේ අවාසනාවක් විය.

1972 වසරේ ඒ විනිශ්වය දීමට මාස ගණනකට පෙර මාබෝ දිවියෙන් සමුගත්තේ ය.

මහ ජාතියේ රගපෑම් ගැන කියන්නට සිදු



ජාතිකයන්ගෙන් සමන්විත නවීන කැන්ගරු දේශයේ මහජනයාගේ කැමැත්ත විමසනුවස් පවත්වන ලද ජනමත විචාරණයට මේ වසරේදී අඩ සිය වසක් පිරෙන බවට මහා ඝෝසාවක් වත්මන් පාලකයන් විසින් පමණක් නොව අද අසරණ ජන කොටසක් බවට පත්ව සිටින ගම්කාරයන් විසින්ද නගනු අද දක්නට ඇති විශේෂ ලක්ෂණයකි.

1967 පැවති ඒ ජනමත විචාරණය සඳහා සමස්ථ ජනතාව පෙළගස්වනු වස් චාර්ල්ස් පර්කින්ස් ආදිවාසී නායකයන් හා සෙසු පිරිස්ද යෙදුණු ඓතිහාසික නිදහස් සංචාරය හෙවත් නිදහස් චාරිකාව ඉතිහාසගත වන්නේ අපේ රටේ පුරවැසිකම අපට දියල්ලා යයි අයැද සිටීම එබඳු ස්වාධීන ජනතාවක් හෑල්ලුවට පත් වූ සැටි කල්පනාවට ගන්නා කල්හිය.

නිව් සවුත් වේල්සයට ආ පාදිලිකෙනෙකු වූ මර්ස්ඩන් නමැත්තා විසින් දේවාශිර්වාද ලෑබීමට තරම් සුදුසු තත්වයට නොපත් ම්ලේච්ඡ ජන කොටසක් හැටියට හඳුන්වනු ලැබූ ඒ ජනතාව එසේ කන්නලව් කරන තැනට හෙළා දමන ලද්දේ 1796 සිට ආක්‍රමණිකයන් හා සිරදඬුවමට පත් වූ අපරාධකාරයන් වශයෙන් මේ මහ දූවට සම්ප්‍රාප්ත වූ ඉංගිරිසි ජාතිකයන් විසින් උන්හිටිතැන් වලින් එලවා දමා සංරක්ෂිත කළාප නම් වූ සිරකඳවුරු වල ඔවුන් කොටු කරමින් කරන ලද මහා ප්‍රාතිහාර්යය හේතු කොට ගෙන ය.

මේ අනුව පෙනී යන අසාධාරණය හා මානසික පීඩනය 1796 සිට 1967 දක්වා කිසිවකුට නොපෙණුන - කිසිවකු ගනිච්චියකට නොගත් - සාමාන්‍ය සිදුවීමක් - සිල්ලර දෙයක් - හැටියට සුදු කලු දෙපක්ෂයම සැලකූ බව අපට සිතා ගත හැකිද? මෙරට ඉතිහාසය හදාරන කවරකුට වුව ද

චෝදනාවකට උසාවියට ඉදිරිපත් කරන ලද ගොතයා තමාගේ පෙරකදෝරුවා විසින් උගන්වන ලද මන්තරය අවසානයේදී ගාස්තුව ඉල්ලන පෙරකදෝරුවාටත් මැතිරීමට නොදෙවෙනි සෙප්පඩ විජ්ජාවක් විය. මේ සුදු මන්තරේට වචන දෙකක් පමණක් ඇත.

**ටෙරා නුලියස්**

ටෙරා නුලියස් යන ලතින් පාඨයේ සිංහල අදහස බිමක් - භූමියක් අහිමි නන්නත්තාරේ යන අභිකුන්ඨික පිරිසක් යන්න ය.

අපේ ගමේ පැරැන්නකුට ඔය කතන්දරය කිව්වොත් ඔහු ගත් කටටම කියනු ඇත්තේ

"ඒකත් හරියට බොලං මගේම රා මටම ගහනවා වගේ වැඩක් නොවැ" කියා ය.

කොහොම හරි මේ විජ්ජාව 1796 සිට 1992 දක්වා සමස්ථ ඕස්ට්‍රේලියානු ජනතාව හා රජය පමණක් නොව ලෝකයත් පිලිගත් බව පෙනෙයි. ඒ මන්තරේ බල බිඳීමට යකැදුරා ඉදිරිපත් වූයේ උතුරුකරයේ පුංචි දූවකිනි. ඔහු උතුරුකරයේ දූවක උපන් එඩ්මන්ඩ් කොයිකි මාබෝ නමැත්තා ය. ක්වීන්ස්ලන්තයේ සරසවියක සුළු සේවකයකු හැටියට රාජකාරි කළ මාබෝ එහි උන් කාලය තුළ අත පත ගා සොයා ගත් කාණ්ඩ හත අටකින් සමන්විත ඉංගිරිසි ග්‍රන්ථයක් කියවූ අතර ඉන් අනාවරණය කරගත් යථාර්ථය සුළු පටු නොවී ය. ඒ සොයා ගැනීම ඔස්සේ ඔහු විසින් ක්වීන්ස්ලන්තයේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද අභියාචනය සඳහා ඔහුට සුදු නීතිඥයන් කිහිප දෙනෙකුගේම සහය සහ උපදෙස් ලැබීම අගනා විනිශ්චයකට මග පෑදීමක් විය. සුදු විනිශ්චයකරුවන් පිරිසක් විසින් දෙන ලද ඒ විනිශ්චය වූයේ කලු මිනසුන්ට මේ භූමියේ අයිතියක් ඇති බවය. ටෙරා නුලියස් සුදු මිථ්‍යාවක් බව ය. ජාතියේ

වන්නේ එතැන් සිට ය. මේ ලියන දිනයට පෙරදිනක රූපවාහිනියේ පෙන්වන ලද දර්ශනයකින් දැක්වූයේ හිටපු අගමැති ටෝනි ඇබට් එඩී මාබෝගේ ස්මාරකය වෙත ගොස් කරන පුෂ්පෝහාරයකි. යට කී තීරණයෙන් ඉකිබිති ඊළග වසරේ එවක සිටි අගමැති පෝල් කීටිං විසින් මාබෝ පනත නමින් අද ජනප්‍රියව ඇති පනත ඉදිරිපත් කරන ලද අවස්ථාව පාඨකයන්ට මතක ඇද්දැයි මම නොදනිමි. මගේ දෙනෙතට අදත් පෙනී යන දර්ශනයක් ඇත. එවක විපක්ෂ නායකයා වූ ආචාර්ය ජෝන් පනතට එරෙහි වූවා පමණක් නොවේ.

අද වූ කලී ඕස්ට්‍රේලියාවට ශෝක දිනයක් වන්නේ ය යයි කීවේ ය.

1992 සිට 2009බදක්වා රට තුළ - දේශපාලකයන් තුළ සිදු වූ වෙනස නොහොත් පරිවර්තනය මැනැවින් පෙනී ගියේ 2009 පෙබරවාරියේ අගමැති කෙවින් රඩ් විසින් පැහැර ගෙන ගිය පරපුර වෙනුවෙන් ජාතියේ ශෝකය හා සංවේගය පළ කිරීමේ යෝජනාව ඉදිරිපත් කරනු ලැබූ කල්හි එය ස්ථිර කිරීමට නැගී සිටියේ ආර්ථික විද්‍යාවෙන් ආචාර්ය උපාධියක් ලද්දකු පමණක් නොව වෛද්‍ය විද්‍යාවේ හසළ දැනුමක් හා පළපුරුද්දක් ඇති ජාතික අනුස-'මරණය බාරව සිටින බ්‍රයන් නෙල්සන් ය.

අගමැති පෙරහර එතැනින් හමාර වන්නේ

නැත. කීටිංගෙන් පසු ඒ තැනට පත් වූ වීරයා වූ කලී ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් ගේ සගයෙකි. ඔහු සමග ස්වෛරී දේශයක් වූ ඉරාකයට කඩා වැදීමට අහිංසක තරුණ තරුණියන් පිටත්කර යැවූ යුද නායකයකුද විය.

ආදි වාසීන්ගේ දුක් ගැනවිලි ගැන කතා කිරීම ඔහුට විකාරයක් ම විය. ඒ සංවාදය හැඳින්වීමට ජෝන් හොවාඩ් යෙදූ නාමයද වැදගත් ය.

"ආදිවාසී කර්මාන්තය"

එය තවත් පඬිවරයකුගේ - ඉතිහාසය පිළිබඳ මහාචාර්යවරයකුගේ නිර්මාණයක් යයි කියනු ලැබේ. එහෙම වූයේ වතාවක් ඔහු උතුරුකරයේ ආදිවාසී ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා ද සංග්‍රාමයක් දියත් කළේ ය. එය හැඳින්වූයේ සංග්‍රාමය නමින් නොව මැදිහත්වීම යනුවෙනි. බුදුන් පැවසූ පරිදි ප්‍රතිඵල යහපත් වන්නේ පිරිසිදු චේතනාවෙන් කළ විට පමණකි. මේ අගමැතිගේ සංග්‍රාමය හෙවත් මැදිහත්වීම ඔහුගේ උඩඟුව හා ඇට්ටරකම ප්‍රදර්ශනය කරන විජ්ජාවක් විය.

ඔහුගේ හිතවත් අනුගාමිකයකු වූ ටෝනි ඇබට් උතුරුකරයට ගොස් ආදිවාසීන් විසින් පිරිනමන ලද මල් මාලාවක් පැළඳ ගෙන මහා එඩිතර ප්‍රකාශයක් කළේ ය. ආදිවාසී ප්‍රශ්න විසඳීමේ බාරදූර රාජකාරිය තමා යටතටම ගන්නා බව පැවසූ ඔහු තමාගේ උපදේශකයා හැටියට හිටපු කම්කරු පක්ෂ සබාපති පත් කලේ ය. ආදිවාසියකු වූ උපදශෙකයා හෝ ඔහුගේ හාම්පුතාට හෝ වෙච්ච දෙයක් නැත .

ආදිවාසී ජනතාව ඔවුන්ගේ දූ දරුවෝ අදත් පරණ තැනටම වැටී පරණ පුරුදු දිවියම ගත කරමින් - පැරණි පුරුදු මත්ද්‍රව්‍යම පරිහරණය කරමින් නිවාස පහසුකම් දරුවන්ගේ අධ්‍යාපනය හිර කූඩුවේ ලැග සිටීම ළමා අපචාර වැනි සකළ විධ ගැටලු වලට මුහුණ දෙමින් පරණ පුරුදු සින්දුව ගායනා කරන්නෝ ය.

